සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 9 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව | කාලය පැ. 2 යි. |
|---|---|---|

නම : ........................................................................ පන්තිය : ......................... විභාග අංකය : ..................

### I කොටස

- ප්‍රායෝගික පරීක්ෂණය සමඟ ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ගැටුමක් නැති`තැන නාට්‍යයක් නොමැත'' යනුවෙන් ප්‍රකාශ කළේ,
    1. විලියම් ශේක්ස්පියර්   2. බර්නාඩ් ෂෝ
    3. බර්ටෝල්ට් බ්‍රෙෂ්   4. භරතමුණි

02. නාට්‍ය පෙළක් මගින් ලැබිය හැකි නාට්‍ය රසය වන්නේ,
    1. ශෘංගාර රසයකි.   2. නාට්‍ය රසයකි.   3. සාහිත්‍ය රසයකි.   4. ලිඛිත රසයකි.

03. ආනුෂංගික අංගයක් වන්නේ,
    1. පිටපත   2. නළු කාර්යය   3. අධ්‍යක්ෂණය   4. නර්තනය

04. භරතමුනි විසින් නාට්‍ය කලාව උදෙසා නිර්මාණය කළ කෘතිය වන්නේ,
    1. පූෂිකදෙන්   2. භරත ශාස්ත්‍රය   3. නාට්‍ය ශාස්ත්‍රය   4. රංග ශාස්ත්‍රය

05. නාට්‍ය කලාවේ මූලිකාංගයක් වන්නේ,
    1. පිටපත් රචනය   2. අංග රචනය   3. සංගීතය   4. ආලෝකරණය

06. ''මනමේ'' නාට්‍යයේ නිර්මාණකරුවා වන්නේ,
    1. එදිරිවීර සරච්චන්ද්‍ර   2. හෙන්රි ජයසේන   3. බන්දුල ගුණවර්ධන   4. දයානන්ද ගුණවර්ධන

07. ''නාට්‍ය ධර්මී' නාට්‍යයක,
    1. සංවාද සංගීතවත් ය   2. වාචික අභිනය භාවිත නොකරයි.
    3. සාමාන්‍ය ගමන් රටා ඇත.   4. රංග වින්‍යාසයක් භාවිත නොකරයි.

08. ''ලෝක ධර්මී'' නාට්‍යයකි,
    1. කදාවළලු   2. දික්තල හා කාලගෝල
    3. කැලණි පාලම   4. මනමේ

09. ගැටුමක් ඇතිවීමට නම්, චරිත අතර එකිනෙකට,
1. සමාන අදහස් ඇති විය යුතුයි. 2. වෙනස්කම් තිබිය යුතුයි.
3. ප්‍රතිවිරුද්ධ අදහස් තිබිය යුතුයි. 4. ඉහත කිසිවක් නොවේ.

10. රංග ක්‍රීඩාවක් වන්නේ,
1. මීයෝ සහ පූසෝ 2. එළුවන් කෑම 3. චක්ගුඩු පැනීම 4. ඔළිඳ කෙළිය

11. භූමිකාවක් යනු,
1. නාට්‍යයක දක්නට ලැබෙන චරිතයකි. 2. චරිත අනුකරණය යි.
3. චරිතයක් දැකිය හැකි විවිධ පැතිකඩ 4. නාට්‍ය රඟ දක්වන රංග භූමිය යි.

12. නාට්‍ය සංගීතය අයත් වන්නේ,
1. ආහාර්ය අභිනයට 2. සාත්වික අභිනයට 3. ආංගික අභිනයට 4. වාචික අභිනයට

13. කදාවළලු නාට්‍යයේ එන චරිත වේ.,
1. සිටු දුව, සේරිවාණිජ, කච්ඡපුට 2. තොටියා, සිටුතුමා, සේරිවාණිජ
3. මිත්තණිය, රජතුමා, මහෞෂධ පඬි 4. සිටුදුව, තොටියා, මිත්තණිය

14. කදාවළලු නාට්‍යය අයත් වන්නේ,
1. තාත්වික ශෛලියට ය. 2. ලෝකධර්මී ශෛලියට ය.
3. නාට්‍ය ධර්මී ශෛලියට ය. 4. ස්වභාවික ශෛලියට ය.

15. කදාවළලු නාට්‍යයේ එන කච්ඡපුට හා සේරිවාණිජ අතර ඇති වන ගැටුම අයත් වන්නේ,
1. මිනිසා අදෘශ්‍යමාන බලවේග අතර ගැටුම 2. මිනිසා හා ඔහුගේ මනස අතර ගැටුම
3. මිනිසා පරිසරය අතර ගැටුම 4. මිනිසා මිනිසා අතර ගැටුම

16. 'කදා වළලු'' නාට්‍යයේ එන වළලු කද අයත් වන්නේ,
1. වේෂභූෂණ වලට 2. රංග භාණ්ඩ වලට
3. ඇඳුම් පැළඳුම් වලට 4. පසුතල නිර්මාණ වලට

17. නාට්‍යයක ''වේෂභූෂණ'' යනුවෙන් හඳුන්වන්නේ,
1. අංග රචනයයි. 2. රඟපෑමට යොදා ගන්නා ඇඳුම් පැළඳුම්
3. රඟපෑමට යොදාගන්නා භාණ්ඩයි. 4. වෙස් ගැන්වීමයි.

18. ''කුමටද සොබනියෙ කඳුළු සලන්නේ'' ගීතය අදාළ නාට්‍ය හා ගයන චරිතය වන්නේ,
1. හුණුවටයේ - ගෲෂා 2. නරි බෑණා - නරියා
3. නරි බෑණා - ගමදුව 4. කදා වළලු - සේරි වෙළෙන්ඳා

19. ශරීරය උණුසුම් කරනු ලබන රංග අභ්‍යාසය වන්නේ,
1. ශිථිලකරණ අභ්‍යාස 2. කටහඬ අභ්‍යාස 3. ශ්වසන අභ්‍යාස 4. තාපන අභ්‍යාස

20. 'කදා වළලු' නාට්‍යයට පාදක කොටගෙන ඇත්තේ,
1. චුල්ලපදුම ජාතකය 2. උම්මග්ග ජාතකය
3. සේරිවාණිජ ජාතකය 4. මහාසාර ජාතකය

(2 x 20 = 40)

## නාට්‍ය හා රංග කලාව
## II කොටස

★ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.
(මුළු ප්‍රශ්න 3කට පිළිතුරු සැපයිය යුතු වේ.) (10 x 3 = 30)

01. i. කදාවළලු නාට්‍ය සඳහා පාදක කරගත් ජාතක කතාව හා කදාවළලු නාට්‍යයේ නිර්මාණකරුවා නම් කරන්න. (ල. 02)
ii. මෙම නාට්‍ය අයත් වන නාට්‍ය ශෛලිය කුමක්ද ? (ල. 02)
iii. කදා වළලු නාට්‍යයේ අන්තර්ගත චරිත දෙකක් ලියන්න. (ල. 02)
iv. මෙම නාට්‍යයට යොදාගෙන ඇති රංග භාණ්ඩ දෙකක් ලියන්න. (ල. 02)
v. කදාවළලු නාට්‍යයේ අධ්‍යක්‍ෂකවරයාගේ වෙනත් නාට්‍ය නිර්මාණ 04 ක් නම් කරන්න. (ල. 02)

02. i. නාට්‍යයක දැකිය හැකි ආනුශංගික අංග දෙකක් ලියන්න. (ල. 02)
ii. ආනුභංගික අංග මගින් නාට්‍යයට ලැබෙන ප්‍රයෝජන 3 ක් ලියන්න. (ල. 03)
iii. ආනුශංගික අංග නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ල. 05)

03. i. ප්‍රධාන රංග ශෛලීන් මොනවාද? (ල. 02)
ii. එම රංග ශෛලීන්ට අදාළ නාට්‍ය වෙන වෙනම ලියන්න. (ල. 04)
iii. එක් රංග ශෛලියක් පිළිබඳවය කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

04. i. ඔබ දන්නා රංග ක්‍රීඩා 3 ක් නම් කරන්න. (ල. 03)
ii. රංග ක්‍රීඩා ආශ්‍රයෙන් රූපණ ශිල්පියෙකුට ලැබෙන ප්‍රයෝජන මොනවාද? 4 ක් ලියන්න.(ල. 04)
iii. දර්පණ තල අභ්‍යාසය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල. 03)

05. i. නාට්‍ය පිටපත් රචකයෙකුගේ හඳුනාගත හැකි පැතිකඩක් නම් කරන්න. (ල. 02)
ii. ''නාට්‍ය පෙළ'' යන්න නිර්වචනය කරන්න. (ල. 03)
iii. නාට්‍යයක ප්‍රේක්‍ෂාව, තේමාව, ශෛලිය වෙන වෙනම කෙටියෙන් හඳුන්වන්න. (ල. 05)

06. පහත සඳහන් කථා තේමාව පාදක කර ගනිමින් නාට්‍යයට සුදුසු පෙළක් නිර්මාණය කරන්න.

ඉගෙනීමට මෙන්ම ක්‍රීඩාවට ද එකසේ දස්කම් දක්වන චමත් ගැමුණු නිවාසයේ නිවාස නායකයා යි. මෙවර නිවාස කුටි නිර්මාණයේ ප්‍රථමස්ථානය ලබා ගැනීමේ දැඩි බලාපොරොත්තුවකින් කටයුතු කරන ඔහු නිවාස කුටියේ අලංකරණය සඳහා කිතුල් මල් සොයා ගැනීමට සිතා අවශ්‍ය උපකරණ ද රැගෙන 9 ශ්‍රේණියේ දරුවන් සමග ගියේ කිතුල් මල් කැපීම සඳහා ය. කිතුල් ගස මුලට ගිය ඔහු විමසිල්ලෙන් වටපිට බලද්දී.....

i. සංවාද හා රංග විධාන සහිත පෙළ නිර්මාණයට (ල. 03)
ii. චරිත අතර ගැටුමක් ඇති වන පරිදි පෙළ නිර්මාණය කිරීම (ල. 03)
iii. දෙගිඩියාව, කුතුහලය හා උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට (ල. 04)

(මුළු ලකුණු 60)

## III කොටස

### ප්‍රායෝගික පරීක්ෂණය - 09 ශ්‍රේණිය

01. කැමති නාට්‍ය ගීතයක් නාට්‍යානුසාරීව ගායනා කරමින් ඉදිරිපත් කිරීම. (ල. 10)

02. ඔබ දන්නා කතාන්දරයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම (ල. 10)

03. ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීම (ල. 10)

04. ගුරු අභිමතය පරිදි ලබා දෙන ලෝක ධර්මී/ නාට්‍ය ධර්මී සංවාද කොටසක් නිරූපණය කිරීම (ල. 10)

05. සමූහ රංගයක් ඉදිරිපත් කිරීම (කෙටි නාට්‍ය නිෂ්පාදනය) (ල. 10)

06. රංග වින්‍යාසකරණය (කණ්ඩායම්) (ල. 10)

ප්‍රශ්න අංක 05 සහ 06 ප්‍රායෝගික වැඩමුළුවක් මගින් ලකුණු ලබා දීම සිදු වේ.